# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2447/54 - 2025 අගෝස්තු මස 01 වැනි සිකුරාදා - 2025.08.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: KDS/MDB/4/2/1/207.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/2/2015/HA/191.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :-

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 745 දරන ඇල්ලියද්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඇල්ලියද්ද ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කර අනුමත කරන ලද, 2021.10.21 වැනි දිනැති අංක මහ 7098 දරන මූලික පිඹුරේ, කැබලි අංක 1 වශයෙන් දැක්වෙන, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0177 (පර්චස් 7.0) ක් පමණ වන අලියාවත්ත නමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අංකය 1 - ඉඩමේ නම: අලියාවත්ත - හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්: එස්.කේ. විජේරත්න මයා, අංක 200බී, ඇල්ලියද්ද, වෙරපිටිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0177 (පර්චස් 7.0)**

ඉඩමේ මායිම්:

*උතුරට*: එස්.කේ. විජේරත්න හිමිකම් කියන අලියාවත්ත; *නැගෙනහිරට*: එස්.කේ. විජේරත්න හිමිකම් කියන අලියාවත්ත; *දකුණට*: ඇළ පාර සහ එන්. ටී. අනෝමා විනීතමාලා හිමිකම් කියන අලියාවත්ත; *බටහිරට*: එන්. ටී. අනෝමා විනීතමාලා හිමිකම් කියන අලියාවත්ත සහ එස්. කේ. විජේරත්න හිමිකම් කියන අලියාවත්ත.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින්, බලයලත් අයවලුන් හෝ 2025 ඔක්තෝබර් මස 15 වැනි දින, පෙ.ව. 10.00 ට මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2025 ඔක්තෝබර් මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන්, ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, ඒකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**නුවන් සී. හේමකුමාර,**
ප්‍රාදේශීය ලේකම්,
මැදදුම්බර.

2025 ජුලි මස 30 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0005